# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1645/29 - 2010 මාර්තු 18 වැනි බ්‍රහස්පතින්දා - 2010.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ කාත්තන්කුඩි නගර සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

නැගෙනහිර පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොටගෙන කාත්තන්කුඩි නගර සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ (1) වගන්තිය යටතේ, සභාපති වන උමාර් ලෙබ්බේ මොහමඩ් නුරුල් මුබීන් නම් වූ සභාපති අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායම් අංක 6 නම් වූ කණ්ඩායම් නායකයාට දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ කණ්ඩායමට අයත් වන්නා වූ ද, ඒ කාත්තන්කුඩි නගර සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී කණ්ඩායම් නායකයා විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා අහමඩ් ලෙබ්බේ මොහමඩ් මර්සූක් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කාත්තන්කුඩි නගර සභාවේ තේරීම්භාර නිලධාරී තුරයිසිංගම් ක්‍රිෂ්ණානන්දලිංගම් වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අහමඩ් ලෙබ්බේ මොහමඩ් මර්සූක් මහතා කාත්තන්කුඩි නගර සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

තුරයිසිංගම් ක්‍රිෂ්ණානන්දලිංගම්,<br>
තේරීම්භාර නිලධාරී,<br>
කාත්තන්කුඩි නගර සභාව.

2010 මාර්තු මස 05 වැනි දින,<br>
මැතිවරණ කාර්යාලය,<br>
මඩකලපුව.

04-86/1


1A - G 12625 — 350 (2010/03)

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ කාත්තන්කුඩි නගර සභාවේ උප සභාපති ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

උප සභාපති, සභාපති ධූරයට පත්වීම හේතු කොටගෙන කාත්තන්කුඩි නගර සභාවේ උප සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී අඥාපනතේ 65අ (1) වගන්තිය යටතේ, උප සභාපති වන අහමඩ් ලෙබ්බෙ මොහමඩ් මර්සූක් නම් වූ උප සභාපති අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායම් අංක 6 නම් වූ කණ්ඩායම් නායකයාට දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ කණ්ඩයාමට අයත් වන්නා වූ ද, ඒ කාත්තන්කුඩි නගර සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී කණ්ඩායම් නායකයා විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සාවුල් හමීඩ් මොහමඩ් අස්පර් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කාත්තන්කුඩි නගර සභාවේ තේරීම්භාර නිලධාරි තුරයිසිංගම් ක්‍රිෂ්ණානන්දලිංගම් වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, සාවුල් හමීඩ් මොහමඩ් අස්පර් මහතා කාත්තන්කුඩි නගර සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

තුරයිසිංගම් ක්‍රිෂ්ණානන්දලිංගම්,
තේරීම්භාර නිලධාරි,
කාත්තන්කුඩි නගර සභාව.

2010 මාර්තු මස 05 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව

04-86/2

---

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ කාත්තන්කුඩි නගර සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

නැගෙනහිර පළාතේ, පළාත් සභාවට තේරී පත්වීම හේතු කොටගෙන කාත්තන්කුඩි නගර සභාවේ සභිකයෙකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

උමාර් ලෙබ්බෙ මොහමඩ් නුරුල් මුබීන් නම් වූ සභිකයා අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායම් අංක 6 නම් වූ කණ්ඩායම් නායකයාට දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ කණ්ඩායමට අයත් වන්නා වූ ද, ඒ කාත්තන්කුඩි නගර සභාවේ සභිකයකු වශයෙන් තේරීම පත්වී සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥා පනතේ 65 අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන තම්බි ලෙබ්බෙ අබ්දුල් බහාජ් මහතා ඉහත කී කණ්ඩායම් නායකයා විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කාත්තන්කුඩි නගර සභාවේ තේරීම්භාර නිලධාරි තුරයිසිංගම් ක්‍රිෂ්ණානන්දලිංගම්, වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, තම්බි ලෙබ්බෙ අබ්දුල් බහාජ් මහතා කාත්තන්කුඩි නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

තුරයිසිංගම් ක්‍රිෂ්ණානන්දලිංගම්,
තේරීම්භාර නිලධාරි,
කාත්තන්කුඩි නගර සභාව.

2010 මාර්තු මස 05 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

04-86/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.